# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2018/15 - 2017 මැයි මස 12 වැනි සිකුරාදා - 2017.05.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රා. ලේ. ගොනු අංකය.*: කේඅයිඩීඑස්/එල්එන්ඩී/01/ඒසීකිව්/07.
*ඉ. අමා. අංකය.*: 4-3/15/2013/වීඊ/163.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තරය:*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළේ මැද පත්තුවේ කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, යටිපව්ව ග්‍රාම නිලධාරී වසමේ යටිපව්ව ගමේ රත්නපුර සර්වේ ජනරාල් විසින් සම්පාදිත පිඹුරු අංක 218 අතිරේක 42 පත්‍ර අංක 45 හි ලොට් 1140, 1141, 1142, 1143, 1144, 1145, 1146, 1147, 1148 ප්‍රමාණය : – හෙක්ටෙයාර් 5.1342

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 ජුනි මස 14 වැනි දින බදාදා පෙ. ව. 9.30ට කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 මැයි මස 31 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

අයි. ආර්. එම්. ප්‍රදීපිකා ඩී. ඉළුක්කුඹුර,
ප්‍රාදේශීය ලේකම්,
කිරිඇල්ල.

2017 මැයි මස 08 වැනි දින,
කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 756

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1A - G 25541 - 17 (2017/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.